# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1983 අංක 47 දරන
# මෝටර් වාහන (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 දෙසැම්බර් මස 08 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 දෙසැම්බර් මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය

මිල : ශත 20 යි | තැපැල් ගාස්තුව : ශත 60 යි

# 1983 අංක 47 දරන මෝටර් වාහන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1983 දෙසැම්බර් මස 08 වන දින.]

එල්. ඩී.—ඕ. 48/82

**මෝටර් වාහන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 1983 අංක 47 දරන මෝටර් වාහන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

203 වන අධිකාරයේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** 1981 අංක 21 දරන පනතින් සංශෝධිත මෝටර් වාහන පනතේ 37 වන වගන්තියෙහි (3) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

"(3) මේ වගන්තිය යටතේ වූ සෑම දැන්වීමක් ම, නියමිත ගාස්තුව සමග එවනු ලැබිය යුතු අතර, බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා වෙත ලියාපදිංචි තැපෑලෙන් එවනු ලැබිය යුතු ය; නැතහොත් පෞද්ගලිකව ඔහු වෙත භාර දෙනු ලැබිය යුතු ය. තව ද දැන්වීමක් පෞද්ගලිකව භාර දෙනු ලබන සෑම අවස්ථාවකදී ම එය ලැබුණු බවට ලිඛිත කුවිතාන්සියක් බලපත්‍ර නිකුත් කිරීමේ බලධරයා විසින් නිකුත් කරනු ලැබිය යුතු ය.".

ජ 073190—11,600 (83/10)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.